**මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**--------------------------------**

**ගම්පහ දිස්ත්‍රික්කය**

**--------------------**

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 30 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) 2018 දෙසැම්බර් මාසය වෙනුවෙන් පළාත් සභාවෙන් ලැබිය යුතු සභික දීමනා රු.750,000 ගිණුම් ගත කර නොතිබුණි. | වර්ෂයට අදාළ ගනුදෙනු නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |
| (ii) සමාලෝචිත වර්ෂය තුළ ලැබූ රු.159,773,625ක් වූ මුද්දර බදු ආදායම මුදල් පදනමට ගිණුම් තබා තිබූ අතර එය ගිණුම් ප්‍රතිපත්ති මඟින් හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සමඟ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී ගිණුම් ප්‍රතිපත්ති මඟින් මුද්දර බදු ආදායම මුදල් පදනමට ගිණුම් තබා ඇති බවට හෙළිදරව් කිරීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 03 ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.3,311,403 ක වෙනසක් විය. | අදාල ශේෂ වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ලේඛන පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) 2018 දෙසැම්බර් 31 දිනට වූ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.797,977 ක් වූ අතර එයින් රු.784,907 ක් 2006 හා ඊට පෙර ශේෂයන් වූයෙන් ඒවා නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) 2015 වර්ෂයට පෙර සිට පැවත එන රු.121,500 ක් වූ ලැබිය යුතු වැටුප් ප්‍රතිපාදන නිරවුල් කර කටයුතු ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) වර්ෂ 04 ක සිට පැවත එන රු.80,825 ක් වූ ජල තැන්පත් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විධිමත් අනුමැතියකින් තොරව වරිපනම් රු.**183,113** ක් කපා හැරීම පිළිබඳ විස්තර ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. | භෞතිකව නොමැති හා බුක්තියෙන් ඉවත් වීම මත කපා හරින ලද රු.414,174 ක වරිපනම් වටිනාකමින් රු.231,061 ක් සඳහා ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇත. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.129,358,930ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,288,135 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් හා බදු | 34,821 | 31,837 | 21,615 | 15,341 | 22,138 | 19,822 | 19,734 | 8,764 |
| (ii) | කුලී | 2,653 | 3,962 | 4,068 | 42 | 2,363 | 2,013 | 1,869 | 148 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,800 | 1,844 | 1,858 | 27 | 1,200 | 1,786 | 1,744 | 42 |
| (iv) | වෙනත් ආදායම් | 476 | 556 | 544 | 122 | 389 | 540 | 590 | 110 |

2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මාබෝදල හා පත්තඩුවන උප කාර්යාල 02 ක මාර්ග කිහිපයක වරිපනම් තක්සේරුවක් කර වරිපනම් අය කිරීම කර නොතිබුණි. | සංවර්ධිත ප්‍රදේශවලින් වරිපනම් අය කර ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කල යුතුවේ. | උප කාර්යාල 02 හි වරිපනම් අය නොකළ දේපළ තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණද මේ වන තෙක් තක්සේරු කිරීම් සිදු කරදී නොමැත. |
| (ආ) | ජාපාලවත්ත කර්මාන්තපුරයේ වානේ සෙවිලි කළ මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්ත ශාලාවක | හිඟ වරිපනම් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අදාල ආයතනය විසින් අභියාචනාධිකරණය මඟින් අදාල තක්සේරු දැන්වීම බල රහිත කරන |

| | | | |
|---|---|---|---|
| | වරිපනම් තක්සේරුව සම්බන්ධයෙන් ව්‍යාපාරික ආයතනය විසින් නඩු කටයුත්තකට ගොස් තිබු අතර එහිදී උසාවිය විසින් සංශෝධිත තක්සේරුව ස්ථිර කර තිබුණද 2018 දෙසැම්බර් 31 දිනට වූ රු.557,600 ක අයවිය යුතු හිඟ වරිපනම් මුදල අය කර ගැනීම සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | | ලෙස ඉල්ලා තිබූ තහනම් නියෝගය අධිකරණය ප්‍රතික්ෂේප කරන ලද බවට දුන් තීන්දුවේ පිටපත අනුව හිඟ මුදල අය කර ගැනීම සඳහා රතු නිවේදනයක් නිකුත් කර ඇති බව දන්වමි. |
| (ඇ) | 2018 ජනවාරි 01 දිනට වරිපනම් හිඟය රු.8,763,667 ක් වූවද සමාලෝචිත වර්ෂය අවසානයට එම හිඟය රු.6,577,572 කින් වැඩිවී තිබුණ අතර සභාව විසින් අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සිදුකර නොතිබුණි. | හිඟ වරිපනම් ආදායම් අය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුවේ. | ඉදිරියේදී වරිපනම් හිඟය අය කිරීම සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරන බව දන්වමි. |

3. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.1 කාර්ය සාධනය
---------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුව විහරණය පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

3.1.1 තිරසර සංවර්ධන ඉලක්ක
--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය අනුව 2015-2030 කාලය තුළ ළඟා කර ගතයුතු තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත අනුව එක් එක් රාජ්‍ය ආයතන බැඳී පැවතුණද ප්‍රදේශිය සභාව විසින් තිරසාර සංවර්ධන අරමණු සහ ඉලක්ක නිශ්චිතවම ඉදිරිපත් කර නොතිබූ අතර එම අරමුණු හා ඉලක්ක මැනීම හා නියාමනය කිරීම සඳහා දර්ශක හඳුනා | තිරසර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සඳහා සැලැස්මක් පිළියෙල කොට නොමැති අතර 2019 වර්ෂයට සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කරන බව දන්වමි. |

ගැනීම, පාදක දත්ත හඳුනා ගැනීම හා වාර්ෂික ඉලක්ක හඳුනා ගැනීම හා එහි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ධාවන තත්ත්වයේ පැවති සභාව සතු කැබ් රථයක් 2018 මැයි 31 දිනෙන් පසු ධාවනයෙන් ඉවත් කර තිබූ අතර 2019 අප්‍රේල් 18 වන දින වන එකතැන ගාල් කර තිබුණි. කෙසේ වුවද 2018 ජුනි 28 දින තාක්ෂණ සේවා කමිටු නිර්දේශය අනුව මෙම වාහනය ධාවනට එක් කළ යුතු බව දන්වා තිබුණි. රියදුරන් ප්‍රමාණවත් නොවීම නිසා විකුණා අළුත් වාහනයක් මිලදී ගැනීමට අදහස් කරන බව වාර්තා කර තිබුණි. | ධාවනයට ගත හැකි වාහනයක් නිසා අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හා රියදුරු පුරප්පාඩු සපුරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම කැබ් රථය සඳහා 2017 ජුනි 28 දින සිට රියදුරෙකු නොමැති වීම හේතුවෙන් ධාවනයට එක්කළ නොහැකි වූ නමුත් 2019 දෙසැම්බර් 10 දක්වා ආදායම් බලපත්‍රය ලබාගෙන ඇත. කෙසේ වුවද 2019 මැයි 10 දින මාසික සභාවේදි ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සම්මත වූ අතර එම වටිනාකම ඵලදායි ලෙස සභාවේ කටයුතු සඳහා යෙදවීමට කටයුතු කරගෙන යන බව දන්වමි. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වත්කම් ලේඛන ගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.1,400,000 ක් සභාව විසින්ද රු.800,000 ක් ක්‍රීඩා සමිතියක් විසින්ද යොදා සභාවට මිලදී ගත් පර්චස් 38.5 ක් වටිනා ඉඩම ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත්කර නොතිබුණි. | සභාවට අයත් දේපල ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කළ යුතුවේ. | ඔප්පුව ලියාපදිංචි කර මෙම සභාවට ලැබුණු පසු ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.4.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මාරපොල බංගලාවත්තේ ඉදිකර තිබූ ප්‍රජාශාලාව 2018 නොවැම්බර් 10 වන විගණිත දිනය වන විටත් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වල් බිහිවී තිබුණි. | දේපල සඵලදායිව ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | මාරපොල බංගලාවත්තේ ප්‍රජාශාලාව සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා සුදුසු පරිදි ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. |

3.4.3 වාර්ෂික තොග සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 අප්‍රේල් 18 වන දිනට තාර තොගයේ ගබඩා ශේෂය හා භෞතික තොගය අතර රු.1,638,320 ක ඌනතාවයක් විය. | තොග ඌනතාවය සොයා බලා ඊට වගකිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් කටයුතු කිරීමට හා පාලන පද්ධතිය වැඩි දියුණු කළ යුතුවේ. | 2019 අප්‍රේල් 18 දින තාර තොගය භෞතික පරීක්ෂාවට ලක් කළ අවස්ථාව වන විට කාල වේලාව නොමැති කමින් 2019 අප්‍රේල් 18 දිනට පෙර මාර්ග ව්‍යාපෘති සඳහා තාර ලැබීම් හා නිකුත් කිරීම් තොග ලෙජරයට ඇතුලත් කිරීමෙන් පසු තාර භෞතික තොගයේ ඌණතාවයක් නොපවතී. |